(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 28. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2024 ජුනි 06 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනුෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය සහ වාරිමාර්ග අමාත්‍යතුමිය

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රේමලාල් ජයසේකර මහතා,** වරාය හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ගරු **ගෝවින්දන් කරුණාකරම් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **නීතිඥ සාගර කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු **ලලිත් වර්ණ කුමාර මහතා**

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු වීරසේන ගමගේ මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දූෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ජගත් ප්‍රියංකර මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"2024 ජුනි 05 දින මාගේ නිවේදනයේ සඳහන් පෙත්සමට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'රාජ්‍ය මූල්‍ය කළමනාකරණ' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

II

"2024 ජුනි 04 සහ 05 දිනවල මාගේ නිවේදනයන්හි සඳහන් පෙත්සම් දහහතරට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'ආර්ථික පරිවර්තන' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් තුනක පිටපත්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2023 වර්ෂය සඳහා ජනාධිපති කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා මන්නාරම සහ යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉදිරිපත් කර, එම වාර්තා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 ජුනි 04 දිනැති අංක 2387/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම**: (1) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු චමල් රාජපක්ෂ මහතා විසින් නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය සඳහා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා විසින් කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හතළිස් හතර වන වාර්ෂික වාර්තාව;

(iii) 2019 සහ 2020 වර්ෂ සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තා;

(iv) 2022 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2021 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) බලශක්තිය හා ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) ගාල්ල, උළුවිටිකේ, ඕපාත, 'නුවන්' යන ලිපිනයෙහි පදිංචි ඕ.ඒ. කලංසූරිය මහතාගෙන් ලැබුණු 2023.12.21 දිනැති පෙත්සම; සහ

(ii) ගිණිමැල්ලගහ, තෙලිකඩ, බොරළුකඩ වත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. කේ. එස්. රුක්ෂාන් මහතාගෙන් ලැබුණු 2024.05.02 දිනැති පෙත්සම

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කොළඹ 06, කිරුලපන, මහවෙල පෙදෙස, අංක 43 දරන ස්ථානයෙහි පදිංචි ජී.එච්. ජානක කුමාර මහතාගෙන් ලැබුණු 2024.02.26 දිනැති පෙත්සම ගරු අනුරාධ ජයරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(3) පැළෑඳ, අක්කර 20, අංක 429/04 දරන ස්ථානයෙහි පදිංචි පී.එච්. චමිලා දිල්රුක්ෂි මහත්මියගෙන් ලැබුණු 2024.03.21 දිනැති පෙත්සම ගරු අනුප පස්කුවල් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) බලංගොඩ, පින්නවල, හිටුවල යන ලිපිනයෙහි පදිංචි එච්.එල්.ඒ.එල්. කුමාරි මහත්මියගෙන් ලැබුණු 2024.01.22 දිනැති පෙත්සම; සහ

(ii) කුරුවිට, මිල්ලවිටිය, අශෝක පෙදෙස යන ලිපිනයෙහි පදිංචි පී.ඒ. අනුලාවතී මහත්මියගෙන් ලැබුණු 2023.12.20 දිනැති පෙත්සම

ගරු වරුණ ලියනගේ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**5. ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ.භා. 11.15 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා.12.59 ට ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.11 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.15 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

"ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.53 ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.50 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 103; විරුද්ධව 59; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය පනස්නවදෙනෙකු (159) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Pavithradevi Wanniarachchi | Yes |
| G 002. Nimal Siripala De Silva | Yes |
| G 003. Chamal Rajapaksa | Yes |
| G 004. Mahinda Rajapaksa | Yes |
| G 006. Susil Premajayantha | Yes |
| G 007. Dinesh Gunawardena | Yes |
| G 009. Douglas Devananda | Yes |
| G 010. Bandula Gunawardana | Yes |
| G 012. Wijeyadasa Rajapakshe | Yes |
| G 014. Ramesh Pathirana | Yes |
| G 015. M. U. M. Ali Sabry | Yes |
| G 016. Vidura Wickramanayaka | Yes |
| G 017. Kanchana Wijesekera | Yes |
| G 018. Manusha Nanayakkara | Yes |
| G 019. Tiran Alles | Yes |
| G 020. Nalin Fernando | Yes |
| G 021. Ajith Rajapakse | Yes |
| G 022. Jeewan Thondaman | Yes |
| G 023. Ranjith Siyambalapitiya | Yes |
| G 025. Dilum Amunugama | Yes |
| G 026. Mohan Priyadarshana De Silva | Yes |
| G 027. Janaka Wakkumbura | Yes |
| G 028. Shehan Semasinghe | Yes |
| G 029. Kanaka Herath | Yes |
| G 030. Thenuka Vidanagamage | Yes |
| G 031. Pramitha Bandara Tennakoon | Yes |
| G 032. Lasantha Alagiyawanna | Yes |
| G 033. Rohana Dissanayaka | Yes |
| G 034. Premalal Jayasekara | Yes |
| G 036. Vijitha Berugoda | Yes |
| G 037. Lohan Ratwaththe | Yes |
| G 038. Tharaka Balasuriya | Yes |
| G 039. Indika Anuruddha Herath | Yes |
| G 040. Siripala Gamalath | Yes |
| G 041. Anuradha Jayaratne | Yes |
| G 043. D.V. Chanaka | Yes |
| G 044. Sisira Jayakody | Yes |
| G 045. Piyal Nishantha De Silva | Yes |
| G 046. Prasanna Ranaweera | Yes |

| | |
|---|---|
| G 047. D. B. Herath | Yes |
| G 048. Shasheendra Rajapaksa | Yes |
| G 049. Seetha Arambepola | Yes |
| G 050. Shantha Bandara | Yes |
| G 051. K. Kadder Masthan | Yes |
| G 052. Asoka Priyantha | Yes |
| G 053. A. Aravindh Kumar | Yes |
| G 054. Geetha Samanmale Kumarasinghe | Yes |
| G 055. Suren Raghavan | Yes |
| G 056. Sivanesathurai Santhirakanthan | Yes |
| G 058. Anupa Pasqual | Yes |
| G 059. Johnston Fernando | Yes |
| G 060. S. B. Dissanayake | Yes |
| G 061. Gamini Lokuge | Yes |
| G 062. Vajira Abeywardena | Yes |
| G 063. Janaka Bandara Tennakoon | Yes |
| G 064. C. B. Rathnayake | Yes |
| G 066. S. M. Chandrasena | Yes |
| G 067. Mahindananda Aluthgamage | Yes |
| G 068. Rohitha Abeygunawardana | Yes |
| G 070. Sarath Weerasekara | Yes |
| G 071. Wimalaweera Dissanayaka | Yes |
| G 074. Kapila Athukorala | Yes |
| G 075. Gayashan Nawananda | Yes |
| G 076. S. M. M. Muszhaaraff | Yes |
| G 077. S. C. Muthukumarana | Yes |
| G 078. Jayantha Ketagoda | Yes |
| G 079. Sampath Athukorala | Yes |
| G 080. Thisakutti Arachchi | Yes |
| G 081. U. K. Sumith Udukumbura | Yes |
| G 082. Pradeep Undugoda | Yes |
| G 083. Sanjeeva Edirimanna | Yes |
| G 084. Akila Ellawala | Yes |
| G 087. Nalaka Bandara Kottegoda | Yes |
| G 089. Kokila Gunawardene | Yes |
| G 090. Milan Jayathilake | Yes |
| G 092. Sudarshana Denipitiya | Yes |
| G 093. Isuru Dodangoda | Yes |
| G 094. Premnath C. Dolawatte | Yes |
| G 095. Muditha Prishanthi | Yes |
| G 096. Sudath Manjula | Yes |
| G 099. Kumarasiri Rathnayaka | Yes |

| | |
|---|---|
| G 101. Upul Mahendra Rajapaksha | Yes |
| G 102. M. Rameshwaran | Yes |
| G 103. Rajika Wickramasinghe | Yes |
| G 104. M. W. D. Sahan Pradeep Withana | Yes |
| G 105. Madhura Withanage | Yes |
| G 106. D. Weerasingha | Yes |
| G 107. Samanpriya Herath | Yes |
| G 108. Sagara Kariyawasam | Yes |
| G 109. Yadamini Gunawardena | Yes |
| G 110. Manjula Dissanayake | Yes |
| G 111. Ranjith Bandara | Yes |
| G 112. Jayantha Weerasinghe | Yes |
| G 114. Lalith Varna Kumara | Yes |
| G 115. S. Jagath Samarawickrama | Yes |
| G 116. M. G. Weerasena | Yes |
| O 006. Gayantha Karunatilleka | No |
| O 007. Lakshman Kiriella | No |
| O 008. Sajith Premadasa | No |
| O 010. Patali Champika Ranawaka | No |
| O 011. Palany Thigambaram | No |
| O 012. Mano Ganesan | No |
| O 015. G.L. Peiris | No |
| O 016. Anura Dissanayaka | No |
| O 022. Kabir Hashim | No |
| O 023. Thalatha Athukorala | No |
| O 024. Abdul Haleem | No |
| O 026. Harsha De Silva | No |
| O 028. R. M. Ranjith Madduma Bandara | No |
| O 029. Dilip Wedaarachchi | No |
| O 030. Niroshan Perera | No |
| O 031. Eran Wickramaratne | No |
| O 032. J. C. Alawathuwala | No |
| O 033. John Seneviratne | Yes |
| O 034. Anura Priyadharshana Yapa | Yes |
| O 036. Dullas Alahapperuma | No |
| O 037. Vijitha Herath | No |
| O 040. Ali Sabri Raheem | Yes |
| O 044. Ashok Abeysinghe | No |
| O 047. Ajith Mannapperuma | No |
| O 048. Buddhika Pathirana | No |
| O 049. M. S. Thowfeek | No |
| O 050. Nalin Bandara Jayamaha | No |

| | |
|---|---|
| O 051. Hector Appuhamy | No |
| O 052. Thushara Indunil Amarasena | No |
| O 053. Dilan Perera | No |
| O 054. Wimal Weerawansa | No |
| O 055. Piyankara Jayaratne | Yes |
| O 057. Harini Amarasuriya | No |
| O 061. Velu Kumar | No |
| O 062. Kavinda Heshan Jayawardhana | No |
| O 063. Mayantha Dissanayake | No |
| O 064. K. Sujith Sanjaya Perera | No |
| O 065. S. M. Marikkar | No |
| O 066. Imran Maharoof | No |
| O 068. Mujibur Rahuman | No |
| O 069. Harshana Rajakaruna | No |
| O 070. Rohini Kumari Wijerathna | No |
| O 071. Hesha Withanage | No |
| O 072. Waruna Liyanage | No |
| O 073. Jayarathna Herath | No |
| O 075. Chandima Weerakkody | No |
| O 076. Dayasiri Jayasekara | No |
| O 081. M. Udayakumar | No |
| O 083. Kins Nelson | No |
| O 085. Udaya Gammanpila | No |
| O 086. Nalaka Godahewa | No |
| O 087. Channa Jayasumana | No |
| O 089. Nimal Lanza | Yes |
| O 090. Jayantha Samaraweera | No |
| O 091. B. Y. G. Rathnasekara | No |
| O 096. K. P. S. Kumarasiri | No |
| O 097. Upul Galappaththi | No |
| O 098. Shan Vijayalal De Silva | No |
| O 106. Wasantha Yapabandara | No |
| O 107. Thilak Rajapakshe | No |
| O 109. Gevindu Cumaratunga | No |
| O 110. Charitha Herath | No |
| O 111. Weerasumana Weerasinghe | No |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තුන්දෙනෙකු (03) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| Marjan Faleel | Yes |
| A.H.M. Fowzie | Yes |
| V. Radhakrishnan | No |

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය

විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(2) මේ වගන්තියේ, 2 වන වගන්තියේ, 3 වන වගන්තියේ, 4 වන වගන්තියේ, 9 වන වගන්තියේ, 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, 10 වන වගන්තියේ (3) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (5) වන උපවගන්තියේ, 14 වන වගන්තියේ, 15 වන වගන්තියේ, 17 වන වගන්තියේ, 18 වන වගන්තියේ, 38 වන වගන්තියේ සහ 39 වන වගන්තියේ සහ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 30 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "යම් දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය:
>
> එසේ වුව ද, එවැනි නියමයක් කිරීමට පෙර මූලික පැවරීමේ සැලැස්ම, ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ඇතුළත් ජාතික විදුලිබල ප්‍රතිපත්තිය, වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලැස්ම සහ දීර්ඝ කාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම මේ පනතේ විධිවිධාන ප්‍රකාරව නිසි ලෙස සකස් කර අනුමත කර ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතු ය;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 7 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "එසේම තවදුරටත්, අමාත්‍යවරයා විසින් පළමුවන අතුරු විධානයේ අවශ්‍යතා සපුරා ඇති බවට සෑහීමට පත් වුවත්, මේ උපවගන්තිය මගින් නියම කරනු

ලබන පරිදි නියමිත දිනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ නොමැති නම්, මේ වගන්තියේ, 2 වන වගන්තියේ, 3 වන වගන්තියේ, 4 වන වගන්තියේ, 9 වන වගන්තියේ, 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, 10 වන වගන්තියේ (3) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (5) වන උපවගන්තියේ, 14 වන වගන්තියේ, 15 වන වගන්තියේ, 17 වන වගන්තියේ, 18 වන වගන්තියේ, 38 වන වගන්තියේ සහ 39 වන වගන්තියේ සහ මේ වගන්තියේ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වගන්තිවල විධිවිධාන හැර, පනතේ විධිවිධාන මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට මාස දොළහක ඉකුත් වූ වහාම ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(3) මේ වගන්තියේ, 2 වන වගන්තියේ, 3 වන වගන්තියේ, 4 වන වගන්තියේ, 9 වන වගන්තියේ, 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, 10 වන වගන්තියේ (3) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (5) වන උපවගන්තියේ, 14 වන වගන්තියේ, 15 වන වගන්තියේ, 17 වන වගන්තියේ, 18 වන වගන්තියේ, 38 වන වගන්තියේ සහ 39 වන වගන්තියේ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු කබීර් හෂීම් මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: ඉංග්‍රීසි භාෂා පිටපතෙහි 3 වැනි පිටුවේ 3 වැනි උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වාක්‍යය ඇතුළත් කිරීමට:—

" For the avoidance of doubt, it is hereby stated that the Appointed Date shall be a date only upon the completion of the first proviso of the subsection (2) of this section."

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු දයාසිරි ජයසේකර මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: ඉංග්‍රීසි භාෂා පිටපතෙහි 2 වැනි පිටුවේ 31 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා ඉවත් කර පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"However, the Minister may, at any time within two months prior to the expiration of the said twelve months, with the approval of the Cabinet of Ministers extend such period, by Order published in the Gazette for another period of six months at a time so however, the aggregate period of such extensions shall not exceed twenty-four months.";

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2 වැනි වගන්තිය

ගරු කබීර් හෂීම් මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: ඉංග්‍රීසි භාෂා පිටපතෙහි 5 වැනි පිටුවේ 14 පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"electricity are met as per the long term power system development plan, whilst ensuring efficient use"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(6) (අ) සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, විදුලි ඉංජිනේරු ශිල්පය සහ පරිපාලන";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු කබීර් හෂීම් මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: ඉංග්‍රීසි භාෂා පිටපතෙහි 7 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"the Constitution Council, one of whom shall be appointed"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: ඉංග්‍රීසි භාෂා පිටපතෙහි 6 වැනි පිටුවේ 3 වැනි වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"THE NATIONAL ELECTRICITY POLICY AND POLICY GUIDELINES

3.(I) The Minister may appoint an Advisory Committee (hereinafter referred to as the "Committee") for the purpose of advising the Minister in formulating the national electricity policy in respect of-

(i) matters relating to the Electricity Industry and formulation of the national electricity policy in terms of section 4 of this Act;

(ii) matters relating to the implementation of the Electricity Industry reforms in accordance with the provisions of this Act, relating to the generation, transmission, distribution, trade, supply and procurement of electricity in Sri Lanka;

(iii) on the modalities relating to the formulation of proposals and plans for the development of the Electricity Industry including the establishment of competitive electricity markets including interconnections with regional markets through the reform process in order to ensure its successful implementation;

(iv) optimal utilisation of indigenous energy resources, including renewable energy, modem technologies and energy efficiency to meet the electricity demand ensuring the least cost principle;

(v) matters related to the preparation of the Long Term Power System Development Plan in terms of the national electricity policy under the provisions of this Act;

(vi) matters relating to the formulation of the national tariff policy, in consultation with the Ministry of Finance and the Regulator, to ensure consumer affordability, financial sustainability and the sustainability of the regulated entities; and

(vii) any other matter connected with or arising out of the national electricity policy.

Provided that, the Committee shall further advise the Minister and provide recommendations on matters relating to the appointment of the board of directors and establishment of the successor companies incorporated as limited companies under the Companies Act, No. 07 of 2007 in terms of section 17 of this Act;

(2) The Committee shall consult the relevant stakeholders and shall act in good faith and in the best interests of the country and the consumers.

(3) The Committee shall consist of the following eight members appointed by the Minister, and the committee shall be directly under the purview of the Secretary to the Ministry of the Minister and the Ministry of the Minister shall provide all necessary facilities for the conduct of the Committee;

(a) Director General of the Department of National Planning;

(b) Director General of Public Utilities Commission of Sri Lanka;

(c) Director General of Sri Lanka Sustainable Energy Authority;

